'පට්ඨානදේශනා මාලාව'
'වීජී වාර' 08.08.2019
සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට සතර පරමාර්ථ ධර්මයන් චිත්ත චෛතසික වශයෙන්, රූප නිර්වාණ වශයෙන් සතර ආකාරයකින් සර්වප්‍රකාරයෙන්ම දැන හඳුනා ගත්තා වූ ඒ සතර පරමාර්ථ ධර්ම සමුදාය හේතුවෙන් හට ගන්නා ධර්ම හැටියටත් හේතුවෙන් හට නොගන්නා ධර්ම හැටියටත් වෙන් කරගෙන අවබෝධ කොටගත්තා වූ ඒ ධර්ම ශක්තිය මහා කරුණාවෙන් ලෝකයාට දේශනාකොට වදාළා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට, ගාම්භීර වූ ධර්මයන් අවබෝධ කර ගැනීමට හැකි සිත් අවබෝධ කරගත්තා වූ ගාම්භීර වූ ධර්මයන් අවබෝධ කර ගැනීමට නොහැකි සිත් කුමක්දැයි කියලා දැනගත්තා වූ තථාගත සම්මා සම්බුදු පියාණන්වහන්සේට, පරමාර්ථය ධර්මයන් දැන ගැනීමට අවබෝධ කර ගැනීමට ශක්තියක් තිබෙන්නා වූ සිත් වලට ඥානවන්ත අයට ඒ ගාම්භීර ධර්මය දේශනාකොට වදාළා වූ ඒවාගේම ශක්තියක් නැති ධර්ම අවබෝධ කරගන්න අමාරු හිත් ඇති අයට ඒ ගාම්භීර දේශනාවන් කරන්නගොස් ඒ අයගේ සිත් වලට පීඩාවක් ඇති නොකළා වූ ඒවාගේම ඒ ප්‍රාථමික සිත් වලට ගැලපෙන ධර්මයන් සරල ආකාරයට දේශනාකොට වදාළා වූ පොදුවේ සියලුම සත්වයන් සසර දුකෙන් මිදී යනවාට කැමැත්තක් ඇත්තා වූ කුසලච්ඡන්දයක් ඇත්තා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මගේ නමස්කාරය වේවා!

ඒ තථාගත සම්මා සම්බුදුපියාණන් විසින් අවබෝධකොට ගත්තා වූ ඒ උතුම් වූ ප්‍රණීත වූ ශ්‍රී සත්ධර්මරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම රත්නයේ ගමන්කොට උතුම් වූ නිර්වාණ ධාතුවට පැමිණියා වූ ඒ නිර්වාණ ධාතුවට පත් වීමේ අදහසින් ඒ ධර්ම මාර්ගයේ ගමන් කරන්නා වූ ශ්‍රාවක මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!


බුද්ධ රත්නයේ අනන්ත ගුණ බලයෙන් ධර්ම රත්නයේ අනන්ත ගුණ බලයෙන් සංඝ රත්නයේ අනන්ත ගුණ බලයෙන් තුනුරුවන් කෙරෙහි චිත්ත ප්‍රසාදනීය ආකාරයෙන් වන්දනා කරගැනීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් සැම දෙනාම ජීවිතියේ දියුණු කරගත්තා වූ වඩා ගත්තා වූ අනන්ත අපරිමාණ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ දවසේ මේ පින්වතුන්ට අපි කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නා වූ ධර්ම කාරණා ටික හොඳින් තේරුම් ගන්න ලැබේවා! හොඳින් වටහා ගන්න ලැබේවා! හොඳින් වටහාගෙන හොඳින් තේරුම් අරගෙන ඒ ධර්ම කාරණා හිතේ දරාගෙන එයට අනුව හිත මෙහෙයවලා මනසිකාරය යොදලා ධර්ම මාර්ගයේ ගමන්කොට චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගෙන අමා මහා නිවනින් සැනසෙන්න ලැබේවා! නිර්වාණ ධාතුවට පත්වෙන්න මෙය මාර්ගයක්ම වේවා කියලා

මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් අද මේ පින්වතුන්ට මේ කරුණු ටික අපි කියලා දෙනවා.

අපි දන්නවා බුදුරජාණන් වහන්සේගේ පට්ඨාන දේශනා විස්තරයේ උන්වහන්සේ පට්ඨාන ධර්ම ගොඩවල් 24ක් කරලා පැහැදිලිව පිරිසිදුව අවබෝධ කරගත්ත බව. ඒ ධර්ම කරුණු ගොඩවල් ටික 24ක් කරගෙන ඒවායේ තිබෙන්නා වූ විවිධ ලක්ෂණ ඒවායේ තිබෙන්නා වූ ආකාර ස්වරූපත් හොඳට හඳුනාගත්තා. එයට අනුකූලව අපි මේ දක්වාම ඒ ප්‍රත්‍යය ධර්ම 24 වෙනම විග්‍රහ කරලා ඊළඟට ඒවා වීථි වාර වශයෙන් කියවෙන තැන් අපි කථාකරගන ආවා. අදට අපිට ඉදිරිපත් වෙලා තිබෙන්නේ ඒ ප්‍රත්‍යය ධර්ම 24 න් තවත් එක ප්‍රත්‍යය ධර්මයක් පිළිබඳව කියන්න. ඒ තමයි **සම්පයුත්ත පච්චය.**

මම හිතන්නේ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය කෙනෙකුට තේරුම් ගන්න ඒ තරම් අපහසු වෙන එකක් නැත කියලා. ඒ උනත් අදට මේ ධර්ම කාරණය ඉදිරිපත් වෙන නිසා ඒකෙ මූලික හැඩ තල ස්වරූපයත් අපි දැන හඳුනා ගන්න ඕනෑ. මේ නාම ධර්ම කියන ඒවා කවදාකවත් තනියෙන් හුදකලාව පහළ වෙන්නේ නෑ. ඒ නාම ධර්මයෝ කියන චිත්ත චෛතසික ධර්මයෝ උපදින්නේම රංචු වලට පොකුරු වලට, එක මිටියකටයි පහළ වෙන්නේ. ඒකෙ හිත ප්‍රධානයි. හිතයි තවත් ඒ හිතට බද්ධ වෙලා තිබෙන චෛතසික ධර්ම පොකුරකුයි පහළ වෙනවා. නමුත් සාමාන්‍ය ව්‍යවහාරයේදී මෙහෙම කියන්නේ නෑ. අපි සමාන්‍යයෙන් කෙනෙකුට අහවන්න පහසු විදියට කියනවා හිතක් පහළ උනා, අදහස් ආවා, තරහක් ආවා, කේන්තියක් ආවා කියලා පොදු ව්‍යවහාරික වචන ඉදිරිපත් කරගෙන හිත ගැන අපි ඔය විදියට කතා කරනවා. හැබැයි අපි මතක තියා ගන්න ඕනෑ කවදාකවත්ම මේ චිත්ත චෛතසික ධර්ම තනියම උපදින්නේ නෑ, සංඛ්‍යාවක් එකට පොදියට පහළ වෙන්නේ. එක පොදියට ඔක්කොම එකට පහළ වෙනවා, එකට නැතිවෙනවා. ඒ පොදිය යම්කිසි තත්පරයක් හෝ වෙලාවක් තිබුණානම් එකටම පවතිනවා.

අපි හිතමු මෙහෙම. ලී කෑල්ලක් අරගෙන අපි හදනවා කැටයක් වගේ හතරැස් කොටුවක්.




එතකොට ඒ කැටයක් වගේ හදපු හතරැස් කොටුවේ තිබෙනවා මුලු 8ක්. කොයි පැත්තට බැලුවත් වටේට මුලු 8 තිබෙනවා. මුලු අට වගේම තීරුත් (edges) තිබෙනවා 12ක්. පැති තිබෙනවා 6ක්. මේ ටික ඔක්කොම (මුලු 8 + තීරු 12 + පැති 6) පහළ වෙන්නේ එකම වෙලාවේ. යම් කිසි වේලාවක් ඒක තිබෙනවාද ඒ කැටේ පිච්චිලා විනාස වෙනකම්ම එකට කැවිලා ඒකෙ කොටසක් වෙලා ඒකට බද්ධ වෙලා තිබෙනවා. එතකොට අපි ඒකට කැටය කියලා කිව්වට ඒ කැටයේ අනු කාණ්ඩ තිබෙනවා. ඒකෙ තිබෙනවා හතරැස් පැති, මුලු, තීරු ඔක්කොම ටික එකට බද්ධ වෙලා තිබෙන්නේ. දැන් අපි මේ කැටේ අරගෙන උඩ දානවා. එතකොට ඒ කැටේ විසි කරපු වේගෙට අතින් ගැලවිලා උඩට යනවා. උඩට යනකොට මුලු 8 ත් පැති 6ත් තීරු 12ත් ඔක්කොම එක රංචුවට එක පොදියට උඩට යනවා. එයින් එකක්වත් මට යන්න බෑ කියලා හැලෙන්නේ නෑ. එක මුල්ලක්වත් එක පැත්තක්වත් අයින් වෙන්නේ නෑ. කැටේ උඩට යනකොට ඔක්කොම එකට උඩට යනවා. යම්කිසි වෙලාවක උඩට ගිහිල්ලා

වැටෙනවා. වැටෙනකොට ඒ පැති 6යි මුලු 8 යි තීරු 12 යි ඔක්කෝම ටික පල්ලෙහාට වැටෙනවා. උඩට යනකොට ඔක්කොම එක රංචුවට උඩට යනවා. පල්ලෙහට එනකොටත් ඔක්කොම එකට පල්ලෙහාට එනවා. යම්කිසි වෙලාවක උඩට ගිහිල්ලා ආපහු හැරෙනකොට ඔක්කොම එකටයි එන්න හැරෙන්නේ. එකක්වත් වැඩි වේගයකින් එන්නේ නෑ. ඒක නිසා මේ කැටයේ තිබෙන්නා වූ ධර්ම ටික එකට ඉපදුනා, යන යන තැනට එකට යනවා, නවතින තැන නවතිනවා, විනාස උනොත් ඔක්කොම ටික විනාස වෙනවා.

මේ වගේ තමයි මේ නාම ධර්මයෝ. නාම ධර්ම ටික එකට පහළ වෙනවා. එකට නැති වෙනවා. තිබෙනවා නම් එකට තිබෙනවා. මේ කැටයේ තිබෙන්නා වූ පැති 6 න් උඩ යට පැති දෙක හැර අපි සරලව එක දෙක තුන හතර කියලා පැති 4 ගත්තොත් මෙයින් පළවෙනි පැත්ත තිබෙන්නේ තුන්වෙනි පැත්තට එනම් ප්‍රතිවිරුද්ධ පැත්තට සාපේක්ෂවයි. හතරවෙනි පැත්ත තිබෙන්නේ දෙවෙනි පැත්තට සාපේක්ෂයි. ඒක නිසා මේ නාම ධර්ම ඔක්කොම අනිත් එකකට සම්බන්ධ වෙලා අනිත් පැත්තක තිබෙන ආධාරය ලබාගෙන තමනුත් ඒ පැත්තට ආධාරයක් වෙලා තමයි ඉන්නේ.

දැන් අපි හිතමු කැටේ මෙසේ උඩින් තැබුවා කියලා. මේ කැටයේ උඩ පැත්ත තිබෙන්නේ යට පැත්ත නිසා. යට පැත්ත තිබෙන්නේ උඩ පැත්ත නිසා. ඒ වගේම හතර වටේ තිබෙන අනිත් පැති තිබෙන්නේත් එක එක පැත්තකට ආධාර වෙලා. එතකොට මේ හැම පැත්තක්ම ඔවුනොවුන්ට උදව් වෙමින් උදව් ලබමින් ඔය විදියට තමයි තිබෙන්නේ. මේ කියන්නා වූ ධර්ම ටික අරගෙන මේ අනුසාරයෙන් අපි චිත්ත චෛතසික ධර්මයෝ ටික බැලුවහම ඒ ධර්ම ටිකත් එක පොදියට එක පොකුරට පහළ වෙලා එක පොකුරට මතුවෙලා රංචුවටම උදව් වෙවී එක විදියට තමයි තිබෙන්නේ. එහෙම එකට මතුවෙලා ඔවුනොවුන්ට උදව් කරගෙන උපකාර කරගෙන ඉන්න ඒ වැඩේට කියනවා 'එකට පහළ වෙලා සම්ප්‍රයුක්ත භාවයෙන් වාසය කරනවා - සම්ප්‍රයුක්ත භාවයෙන් පහළ වෙනවා - සම්ප්‍රයුක්ත භාවයෙන් එකට ඉන්නවා' කියලා.

එතකොට මේ එකට පහළ වෙන ධර්ම තමයි සිත් සහ චෛතසික. පරමාර්ථ ධර්ම ගොඩවල් හතරක් තිබෙනවා. එතකොට ප්‍රශ්නයක් එනවා, ඉතිරි පරමාර්ථ දෙක එනම් රූප ධර්ම සහ නිර්වාණ ධර්ම උපදින්නේ නැත්ද කියල. ඇත්තටම රූප ධර්ම හිතට සම්බන්ධ නෑ. ඒ රූප ධර්ම සිතට පරිබාහිරව තිබෙන්නා වූ වෙනමම ආකාර විශේෂයක තිබෙන ධර්ම සමුදායක්. හැබැයි නාම ධර්ම කියන චිත්ත චෛතසික ධර්ම අමුතුම විදියේ බල ධර්ම ටිකක්. ඒවා ඇඳලා පෙන්නන්නත් බැරි නැතෙයි කියන්නත් බැරි හොඳටම තිබෙන බල ගැන්විච්ච ධර්ම ස්වභාවයක්. ඒක නිසා මේ නාම ධර්ම වල චිත්ත චෛතසික ධර්ම හරි වෙනස්, රූප ධර්ම වගේ නොවෙයි. රූප ධර්මත් හේතුවෙන් හටගන්නවා නාම ධර්මත් හේතුවෙන් හටගන්නවා. නමුත් නිර්වාණ ධාතුව හේතුවෙන් හටගන්නා එකක් නොවෙයි. ඒක මේ පැත්තට සම්බන්ධ නැති නිසා ඒක අයින් කරනවා. නාම ධර්ම වල චිත්ත චෛතසික ධර්මයෝ එකට උපදිනවා එකට පහළවෙනවා එකට ඉන්නවා සම්ප්‍රයුක්ත භාවයෙන් ඉන්නවා කියන්නේ ඒකයි.

සම්ප්‍රයුක්ත භාවයෙන් එකට පහළ වෙන මේ ධර්මයෝ වීථි සම්බන්ධයෙන් කථා කරනකොට මේ මාතෘකාව යටතේ උගන්වන්නේ වීථි තුනක් පමණයි. ඒකට හේතුව ගොඩවල් තුනක විතරයි මේක වැඩ කරන්නේ. ඒ ගොඩවල් තුන තේරුම් ගැනීම සඳහා තමයි අපි ධම්ම සංගණියේ තික මාතිකාවේ ආරම්භක ස්ථානයට ගිහිල්ලා බැලුවහම

තිබෙන්නේ **කුසලා ධම්මා - අකුසලා ධම්මා - අබ්‍යාකතා ධම්මා**. මේ දහම් පද තුනට අනුකූලව තමයි මේකේ වීථි වාර අපිට කියලා දෙන්නේ. මේවා සහජාත ධර්ම. මේවා එකට පහළ වෙලා එකට සම්ප්‍රයුක්ත වෙලා තිබෙන ධර්ම. කුසල් මිශ්‍ර වෙන්නේ නෑ අකුසල් වලට. අකුසල් මිශ්‍ර වෙන්නේ නෑ කුසල් වලට. අව්‍යාකෘත වැඩ කරන්නේ නෑ කුසල් අකුසල් සමග සම්බන්ධ වෙලා. ඒක නිසා තමයි ඔය විදියට වෙන් කරලා මේක කථා කරන්නේ.

අපි බලමු සම්ප්‍රයුක්ත ධර්ම මාතෘකාව යටතේ කියවෙන විස්තරය කොහොමද කියලා. මේක තික මාතිකා යටතේ සඳහන් වෙන්නා වූ ධර්ම කාරණා.

1) වෙනි වීථිය

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො – කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් කුසල ධර්මයෝ සමග පහළ වෙනවා. කුසල ධර්මයකට සම්ප්‍රයුක්ත භාවයෙන් එකට පහළ වීම වශයෙන් සහයෝගීව එකට ඉදීම් වශයෙන් උපකාර වෙනවා.

මේක තේරුම් ගැනීමට තමයි මම අර හතරැස් කැටයක උපමාව මේ පින්වතුන්ට මතක් කළේ. කැටයේ තිබෙන්නා වූ හැම පැත්තක්ම ගත්තහම ඒවා පිටින් ආපු ඒවා නොවෙයි. කැටේක තිබෙනවා පැති හයක්. ඒ පැති හයම කැටයට සම්බන්ධ පැති. එකම පැත්තක්වත් එතැනින් ගැලවිලා යන්න බෑ. ඔක්කොම ඔවුනොවුන්ට බද්ධ වෙලා තිබෙන්නේ. එකම කැටයේ හය පැත්තම එක එක පැත්ත බාර අරගෙන පිහිටා තිබෙනවා වගේ හිතක තිබෙන මේ නාම ධර්ම සමුදාය ඒ ඒ කෘත්‍යයන් කරමින් ඒ ඒ වැඩ කරමින් ඒ ඒ ආකාර දක්වමින් පොකුරකට ඉන්නවා.

දැන් මේකේ ප්‍රශ්නයක් තිබෙනවා මෙහෙම. හතරැස් ලී කැටය ගත්තොත් එහෙම ඒකෙ තිබෙන්නා වූ පැති 6 අපිට තේරුම් ගන්න පුළුවන්. ඒකෙ තිබෙන මුලු 8 අපිට තේරුම් ගන්න පුළුවන්. ඒකෙ තිබෙන තීරු 12 ත් අපිට වෙන වෙනම තේරුම් ගන්න පුළුවන්. නමුත් නාම ධර්ම වල තිබෙන්නා වූ සියුම් ස්වභාවයන් තේරුම් ගන්න අමාරුයි. කැටය ඕලාරිකයි නාම ධර්ම සියුම්. ඒක හරියට කියනවානම් වතුරේ තිබෙනවා අපේ ඡායාව වැටෙන ගතියක්. වතුරයි වතුරේ වැටෙන ඡායවයි කියන එක එක තැන තිබෙන්නේ. වතුර හෙලවි හෙලවි අපේ ඡායවත් ඒකට වද්දාගෙන පවතිනවා. එක ධර්මයක ආකාර විශේෂ ගණනාවක් තිබෙනවා. නමුත් ඒවා තේරුම් ගන්නකොට එක වෙලාවකට ඕකේ එක කෑල්ලක් විතරයි අපිට දැන ගන්න හිත යොදන්න පුළුවන් කම තිබෙන්නේ. මේ නාම ධර්ම වල තිබෙනවා එක එක රටා. එක එක ශක්ති. එක එක ස්වභාවයේ තිබෙන ගුණ විශේෂ තිබෙනවා. ඒ ගුණ විශේෂයෝ ඒ ශක්ති විශේෂයෝ ඒ චෛතසික ධර්ම විශේෂයෝ එක පොදියට අපිට තේරුම් ගන්න බෑ. එක වෙලාවකට එකක් පමණක් තේරුම් ගන්න පුළුවන්. එහෙම අපිට තේරුම් ගන්න බැරි උනාය කියලා ඒවා නැතුව නොවෙයි. ඒවා තිබෙනවා. සාමාන්‍ය කෙනෙකුට ඒවා වටහා ගන්න බැරි ඒවා

වෙන්කරන්න ඒවා කඩන්න ඒවා වෙන්කරලා බලා දැන ගන්න පුළුවන් හයිය තිබෙන ශක්තිය තිබෙන ප්‍රඥාව කියන ගුණය හිතේ නෑ, ඒක නිසා තේරුම් ගන්න බෑ.

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් කුසල ධර්මයකට සම්ප්‍රයුත්ත භාවයෙන් එකට සහයෝගයෙන් කටයුතු කිරීම් වශයෙන් උපකාර වෙනවා කියන එකයි. එතකොට අපි තේරුම් ගන්න ඕනෑ මොනවාද කුසල ධර්ම කියන්නේ කියලා. කුසල ධර්ම කියලා කියන්නේ කුසල ශක්තිය තිබෙන ඵලයක් ඉපදවීමට කලින් පහළ වෙන ධර්ම ශක්තීන්ට කියනවා කුසල ධර්ම කියලා. ඒ තමයි කුසල සිත් 21. ඒ කුසල සිත් 21 සමග ඒකට යාබදව ඒකට ගැලපෙන ආකාරයෙන් පහළ වෙන්නා වූ සමාන ගති පැවතුම් ඇති කුසල චෛතසික 38 ක් තිබෙනවා.

**කුසල චෛතසික 38 + කුසල සිත් 21 = කුසලා ධම්මා**

පොදු වශයෙන් අපි මේවා කිව්වට මේවා පහළ වෙනකොට පහළ වෙන්නේ වෙන වෙන කාණ්ඩ එක්ක. මේ ටික තමයි කුසල ධර්ම කියලා කියන්නේ. (කුසල් සිත් 21 සහ ඒවාට ගැලපෙන විදියට පහළ වෙන්නාවූ චෛතසික ධර්ම 38)

අපි උදාහරණයකට ගත්තා කාමාවචර කුසල් සිතක්. කාමාවචර කුසල් සිතක අපි හිතමු කුසල චෛතසික 33 ක් පහළ වෙනවා කියලා. කුසල් සිත සමග නාම ධර්ම සියල්ල 34ක් වෙනවා. මේ නාම ධර්ම පොකුර එකට ඉන්නකොට ඔවුනොවුන්ට උදව් වෙනවා. උදාහරණයක් හැටියට මිනිස්සු 34 දෙනෙක් යනවා. මිනිස්සු 34 දෙනා cluster එකකට හිටියහම ඔවුන්ට group එක කියලා කියන්න පුළුවන් කම තිබෙන්නේ ඒ 34 දෙනා ඔවුනොවුන්ට උදව් වෙනවා. 34 කියන සංඛ්‍යාව එක cluster එකකට එක group එහෙකට කථා කරන්න පුළුවන් කම තිබෙන්නේ එකේ (1) ඉඳලා. එකේ ඉඳලා තමයි 34 දක්වා යන්නේ. යම්කිසි කෙනෙක් ඒකෙන් අඩු උනානම් 34 කියන සංඛ්‍යාව ගැන කථා කරන්න බැරි වෙනවා. එතකොට 33 ක් වෙනවා. 34 කියලා කියන්න පුළුවන් කම තිබෙන්නේ ඒකෙ පළවෙනි එක්කෙනාගේ බලයත් තිබෙනවා දෙවෙනි එක්කෙනාගේ බලයත් තිබෙනවා තුන්වෙනි එක්කෙනාගේ බලයත් තිබෙනවා. ඒක නිසා හැම එක්කෙනාගේම බලය තිබෙනවා. ඇත්තටම 34 කියන කොට 1-34 දක්වා හැම කෙනාගේම සහය තිබෙනවා. මේ හැම එක්කෙනාම එකතු වෙලා තමයි 34 කියලා කියන්නේ. ඉතින් මේ වගේ නාම ධර්ම ටික ඔක්කෝම එකතුවෙලා එකට පහළ වෙලා සහයෝගයෙන් පැවතීම වශයෙන් සම්ප්‍රයුක්තක භාවයෙන් උදව් වෙනවා. තමන් වෙනත් කෙනෙකුට පිහිට වෙන ගමන් තමනුත් පිහිටක් හදාගන්නවා. ප්‍රත්‍යය ස්වභාවයත් තිබෙනවා, ප්‍රත්‍යය උප්පන්න ස්වභාවයත් තිබෙනවා.

ඒක තවත් විස්තර ක්‍රමයකට කියනවා ස්කන්ධ යන වචනය දාලා.

- **කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො**

උදාහරණයකට අපි ගත්ත කුසල සිත සහ චෛතසික 33 කියන නාම ධර්ම ටික ගත්තහම ඒක ගොඩවල් හතරකට බෙදෙනවා. ගොඩවල් හතරකට බෙදන්නේ **ස්කන්ධ** නමින්. වේදනාව කියන චෛතසික අපි අයින් කරලා ඒකට කියනවා **වේදනා ස්කන්ධය** කියලා. ඉට පස්සේ සංඥාව අරගෙන පැත්තකින් තියලා අපි ඒකට කියනවා **සංඥා ස්කන්ධය** කියලා. එතකොට වේදනා චෛතසිකයෙන් නියෝජනය වෙනවා වේදනා ස්කන්ධය.

සංඥා චෛතසිකයෙන් නියෝජනය වෙනවා සංඥා ස්කන්ධය. ඉතිරි චෛතසික 31 ටම කියනවා අපි **සංස්කාර ස්කන්ධය** කියලා. හිතට කියනවා **විඤ්ඤාණ ස්කන්ධය** කියලා. දැන් මේ චිත්ත චෛතසික වශයෙන් තිබුණ 34 දෙනා සකන්ධ වශයෙන් අපි ගොඩවල් 4 කට හදාගත්තා. එහෙම කරලා අපි බලනවා **කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො කියලා.** ඒ තමයි කුසල් සිතේ තිබෙන්නා වූ එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනට බලපාන විදිය.

වේදනා ස්කන්ධය අනිත් ස්කන්ධ වලට බලපානවා. වේදනා ස්කන්ධයට ඉන්න පුළුවන් කම තිබෙන්නේ අනිත් ස්කන්ධ ටික හිටියොත් පමණයි. ඒ අයට එන්න පුළුවන් කම තිබෙන්නේ වේදනා ස්කන්ධය හිටියොත් පමණයි. ආන්න ඒ වගේ එක ස්කන්ධයක් ස්කන්ධ තුනකට සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාර වෙන ස්වභාවයක් තිබෙනවා = **කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො.**

අනිත් එක තමයි **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො.** දැන් අපි මේ ගොඩවල් හතර වෙන් කරලා අරගෙන ඒ ගොඩෙන් එක ගොඩක් අනිත් තුන් ගොඩට බලපානවා කියලා කිව්වොත් ඒවගේම අනිත් පැත්තට ඒ ගොඩවල් තුන එක්කෙනාටත් බලපානවා. එහෙම ධර්ම ස්වභාවයක් තිබෙනවා. මේ ක්‍රමය තේරුම් ගන්න පුදුම විදියේ අතිශය සියුම් වෙච්ච ඥාන සම්පත්තියක් තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක එහෙම බලපානවද හේතුවෙනවද කියලා කෙනෙකුට එහෙම ලේසියෙන් හඳුනා ගන්න බෑ. නමුත් එහෙම තිබෙනවා.

එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනටම පිහිට වෙනවා. ඒ ස්කන්ධ තුන එක ස්කන්ධයකට පිහිට වෙනවා. ඒක නිසා කියනවා **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො.**

**ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = ස්කන්ධ දෙකක් අනිත් ස්කන්ධ දෙකට උදව් වෙනවා. ඒ ස්කන්ධ දෙක තව ස්කන්ධ දෙකකට උදව් වෙනවා. මේ විදියට තමයි මේක සිද්ධ වෙන්නේ.

මෙන්න මේ විදියට කුසල ධර්මයන්ට හිත යොදලා කුසල ධර්මයන්ගේ තිබෙන්නා වූ චිත්ත චෛතසික ධර්ම සමුදාය ඔවුනොවුන්ට පිහිට වේවි ඔවුනොවුන් සමග එකට ගැවසෙන, එකට පහළවෙන ස්වභාවය පිළිබඳව කුසල වශයෙන් වෙන් කරලා දැන ගැනීමට කියනවා කුසල ධර්මයෝ කුසල ධර්මයන්ට සම්ප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වෙන වීථිය දැනගන්නවා කියලා.

දැන් අපි අනිත් පැත්තට යමු.

2) දෙවෙනි වීථිය

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො – අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො**

මේ කියන්නේ අකුසල් සිත් ගැන. අකුසල් සිත් 12 තිබෙනවා. ඒකට ගැලපෙන චෛතසික ධර්ම 27 ක් තිබෙනවා. මේ අකුසල සිත් 12 චෛතසික ධර්ම 27 එකම වෙලාවක නොවෙයි පහළ වෙන්නේ. ලෝභ මූල සිත් වෙනම පහළ වෙනවා. ද්වේශ මූල සිත් වෙනම පහළ වෙනවා. මෝහ මූල සිත් වෙනම පහළ වෙනවා. ඉතින් මේ කියන්නා වූ අකුසල ධර්මත් ඒකට ගැලපෙන cluster එකකට එක රංචුවකට තමයි පහළ වෙන්නේ. මේ ධර්ම යම් කිසි වෙලාවක පහළ උනාද ඒ වෙලාවේදී ඒ නාම ධර්මයෝ එකිනෙකට උදව්වෙමින් 'තනි නැතුව ඉන්නවා' කියලා සලකනවා.

තව එකක් තිබෙනවා. ඒක තිබෙන්නේ suburbs වල. මිනිස්සු ඔවුනොවුන්ට පිහිට වෙනවා, කථා කරන්නේ නැතුව. සමහර පැතිවල මිනිස්සු ගෙවල් ගන්නවා. ඒ අය ගෙවල් ගන්නේ ඒ පළාතේ මිනිස්සු ජීවත් වෙනවද කියලා බලලා. තමන් තනියම ඉන්න යන්නේ නෑ. සමහර වෙලාවට ඒ පාරේ ගෙවල් දහයක් තිබෙනවා නම් ඒ දහයෙන් නමයක් හිස් තිබෙද්දී තමන් තනියම ඉන්න යන්නේ නෑ. ඒ පාරේ තවත් කට්ටිය ජීවත් වෙනවා කියලා දැනගත්තොත් එයා ගෙයක් ගන්නවා. එතකොට තනි නෑ. ඇත්තටම බැලුවොත් අනිත් ගෙවල් නමයේ ඉන්න මිනිස්සු මෙයාව ආරක්ෂා කරන්න කිසිසේත්ම එන්නේ නෑ. සමහර විට දකින්නෙත් නෑ. එයා ඒ තමන් ගත්ත ගෙදරට යනවා, තමන් ඒ ගෙදර ජීවත් වෙනවා. අනිත් අය හොයන්න බලන්නේ නෑ. ජේන්නෙත් නෑ. යනවෙලාව දන්නෙත් නෑ. නමුත් අනිත් ගෙවල් වල මිනිස්සු ජීවත් වෙනවා කියන සංඥාව තිබෙනවා. ඒකත් එක්ක අනිත් ගෙවල් නමයේ ඉන්න මිනිස්සු ටික මෙයාට නොපෙනී නොදැනී තනි රකිනවා. ඉතින් එයාට හැඟීමක් තිබෙනවා අවට ගෙවල් වලත් මිනිස්සු ඉන්නවා කියලා. ඒවගේම අනිත් ගෙවල් වල ඉන්න මිනිස්සුන්ටත් හැඟීමක් තිබෙනවා මේ ගෙදරත් කෙනෙක් ඉන්නවා කියලා. ඒ වගේ මේ සම්ප්‍රයුත්ත භාවය ඔවුනොවුන්ට උදව් කරන විදියෙ ඔන්න ඔය වගේ ස්වභාවයක් තිබෙනවා.

අකුසල ධර්මයෝ පහළ වෙනකොට වෙන වෙනම පහළ වෙනවා. පහළ වෙච්ච වෙලාවේදී ඒ චෛතසික ධර්ම එකට ඉදීම් වශයෙන් එකට පහළ වීම් වශයෙන් එකට යෙදීම් වශයෙන් සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා උපකාර වෙනවා. මේ කියන්නා වූ අකුසල සිත් 12 සහ ගැලපීයන චෛතසික ධර්ම 27 දෙනාත් ගොඩවල් 4 කට කැඩුවොත් ඒකෙත් තිබෙනවා විඥ්ඥාණය - වේදනාව - සංඥාව සහ වැඩිපුර චෛතසික ටිකක් තිබෙන සංස්කාර වශයෙන් ගොඩවල් හතරක් වෙනවා.

- **අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = අකුසල වශයෙන් සලකන හිතක වේදනාව හෝ සංඥාව හෝ සංස්කාර හෝ කුමක් හෝ එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා උපකාර වෙනවා.

- ඒවගේම තමයි **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො** = ස්කන්ධ තුනක් එක ස්කන්ධයකට උදව් වෙනවා උපකාර වෙනවා සම්ප්‍රයුක්ත භාවයෙන්.

- **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = ස්කන්ධ දෙකක් තවත් ස්කන්ධය දෙකකට උපකාර වෙනවා සම්ප්‍රයුක්ත භාවයෙන්.

3) වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො – විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො** = අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සම්ප්‍රයුක්ත භාවයෙන් ඉදිරිපත් වෙනවා. ඒ තමයි විපාක වශයෙන් ඉදිරිපත් වෙන සිත් 36 සහ ක්‍රියා සිත් 20 සමග පහළ වෙන ගැලපෙන චෛතසික ධර්ම තිබෙනවා 38ක්. මේ ටිකට තමයි අව්‍යාකෘතයෝ කියලා කියන්නේ. මේ අව්‍යාකෘත ධර්මයක් කොයියම් වෙලාවක හරි එකට පහළ උනොත් ඔවුනොවුන් ඔවුනොවුන්ට උදව් කරගන්නවා, උපකාර කරගන්නවා. අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට උදව් කරනවා කියන තැනදී විස්තර ටිකක් වැඩිපුර කියලා දෙනවා, ප්‍රතිසන්ධි අවස්ථාව සහ ප්‍රවෘත්ති අවස්ථා තිබෙන නිසා.

- **විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = විපාක සහ ක්‍රියා අව්‍යාකෘත ධර්ම එක ස්කන්ධයක් හැටියට අනිත් ස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා.

- **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො** = ස්කන්ධ තුනක් එක ස්කන්ධයකට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා.

- **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = ස්කන්ධ දෙකක් අනිත් ස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා.

- **පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්තපච්චයෙන පච්චයො** = ප්‍රතිසන්ධි අවස්ථාවේ එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා. ස්කන්ධ තුනක් එක ස්කන්ධයකට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා. ස්කන්ධ දෙකක් අනිත් ස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත භාවයෙන් උදව් වෙනවා.

මේක සංඛ්‍යා වශයෙන් එකයි දෙකයි තුනයි හතරයි කියලා කිව්වට ස්ථාන වශයෙන් කාල වශයෙන් පටිසන්ධි අවස්ථාවේදීත් ඊළඟට ප්‍රවෘත්ති අවස්ථාවේදීත් මේවා පහළ වෙනවා.

ඒ වගේම ධර්මය කථා කරන මේ අවස්ථාවේදීත් අපිටත් බොහෝ කුසල චෛතසික පහළ වෙනවා කුසල් සිත් එක්ක. මේ වෙලාවේ අපි බණක් අහමින් සද්දයකට සිත යොමුකරන්නේ ඔය පොදියක් වශයෙන් පහළ වෙන නාම ධර්ම සමුදාය නිසා. මේ නාම ධර්ම සියල්ල පහළ වෙන වෙලාවේදීම ඔවුනොවුන්ට මහා උදව්වක් උපකාරයක් කරගෙන තමයි මතු වෙන්නේ, උදව්වක් උපකාරයක් කරගෙන තමයි නැති වෙලා යන්නේ.

1. **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො**
2. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො**
3. **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සම්පයුත්තපච්චයෙන පච්චයො**

යන වීථි වාර තුන තමයි මේ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය යටතේ කියලා දෙන්නේ. මේකේ වාර තුනක් තිබෙන නිසාත් මේ පින්වතුන් මේ දක්වා මීට සමාන දේවල් අහලා හිතලා තිබෙන නිසාත් මම හිතනවා මේක තේරුම් ගන්න අමාරුවක් අපහසුවක් මේ පින්වතුන්ට නෑ කියලා.

තවත් එකක් තමයි 'තථාගතයන් වහන්සේගේ ඥානය, තථාගතයන් වහන්සේගේ පිරිසිදු නුවණින් ස්පර්ශ කරන ධර්ම මෙන්න මේවා නේද, මෙන්න මෙහෙම නේද මේ සර්වඥතාඥානයෙන් මේවා පිළිබඳ හැඩ තල බැලුවේ, දැක්කේ, මේ වගේ සියුම් ස්වරූප දකින්න පුළුවන් මහා තීක්ෂණ ප්‍රභාෂ්වර ඥාන ගතියක් නේද තථාගතයන් වහන්සේට පිහිටා තිබුණේ, උන්වහන්සේගේ ඥාන ශක්තියෙන් මේ ඔක්කොම ටික දැන දැක අවබෝධ කරගෙන නේද අපිට ප්‍රකාශ කළේ' කියන ඒ බුද්ධ ගෞරවය බුදුරජාණන් වහන්සේගේ ඥානයේ තිබෙන්නා වූ පිවිතුරු කම අපිට තේරුම් යනවා මේ ගාම්භීර ධර්ම කථනයන් මේ විදියට ගොනුකරගෙන හිතාගෙන මෙනෙහි කරගෙන යනකොට. ඒක නිසා මේ පට්ඨානය ගැන කීම ඒවගේම පට්ඨානය ගැන මෙනෙහි කිරීම පට්ඨානය ගැන ඉගෙන ගැනීම මේ කොටස සම්පූර්ණ කර ගැනීමක් විතරක්ම නොවෙයි, බුදුරජාණන්වහන්සේගේ බුදුගුණ මේ අනුසාරයෙන් අපේ හිත් වලට නිකම්ම ඇවිල්ලා තැවරිලා යනවා. මේක හොඳට ගැඹුරින් පරිහරණය කරනකොට අපිට පුදුම විදියට ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ බුද්ධ ඥානයේ තිබෙන විසිතුරු කම බුද්ධ ඥානයේ තිබෙන සූක්ෂමකම බුද්ධ ඥානයේ තිබෙන හැඩ වැඩ අපිට හොඳට වැටහෙනවා. ඒක බුදුගුණ භාවනාවකුත් වෙනවා. ඒක නිසා අද මේ පින්වතුන්ට මම මේ ටික තමයි කෙටියෙන් මතක් කළේ.

හැම කෙනාම සතුටු වෙන්න. හැමකෙනාම ශ්‍රද්ධාවෙන් චිත්තප්‍රබෝධය හදාගෙන මේ ගාම්භීර වූ අතිශය කලාතුරකින් අහන්න කියන්න ලැබෙන ධර්ම කොට්ඨාසයක් අපි මේ කාලය තුල දැනගන්නවා, ඉගෙන ගන්නවා, හිතනවා. ඒක අපිට ධර්ම වාසනාවක් ධර්ම භාග්‍යක් කියලා හිතන ගමන් මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේ කෙළවර මේ කියන්නා වූ ධර්ම ස්වභාවයෝ නැති, ඒ කියන්නේ සම්ප්පයුත්තක භාවයක් කිසි ආකාරයකින් ක්‍රියාත්මක වෙන්නේ නැති තැනක් තිබෙනවා. සම්පයුත්තක භාවය ක්‍රියාත්මක වෙන්නේ නැති තැන තමයි නිර්වාණ ධාතුව.

නිර්වාණ ධාතුවේ සම්පයුත්ත ප්‍රත්‍යය නෑ. නිර්වාණ ධාතුව හේතුවකින් හටගන්නා චිත්ත ධර්මයකුත් නොවෙයි හේතුවකින් හටගන්නා චෛතසිකය ධර්මයකුත් නොවෙයි.

නිර්වාණ ධාතුව ස්කන්ධ කොටසට එන්නෙත් නෑ. ඒක නිසා සම්පයුත්ත ප්‍රත්‍යය නැති සම්පයුත්ත ප්‍රත්‍යය උපන්නයකුත් නොවෙන ප්‍රණීත වූ ධර්ම ස්වභාවයක් තමයි නිර්වාණ ධාතුව. ඒ නිර්වාණ ධාතුව සැම දෙනාටම සුවසේම අවබෝධ වේවා! ඒ ධර්මය අවබෝධ කරගන්න මේ ධර්ම මනසිකාරය සැම දෙනාටම හේතු වාසනා වේවා කියලා අපි මෛත්‍රීයෙන් පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

**ප්‍රශ්නය -** ස්වාමීන්වහන්ස අවසරයි ඔබවහන්සේ දේශනා කළා චිත්ත චෛතසික රූප නිර්වාණ කියන ධර්ම හතර ගත්තොත් එහෙම සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය තිබෙන්නේ චිත්ත චෛතසික ධර්මයන්ට පමණයි කියලා. කලින් අවස්ථාවලදී අපි චිත්තජ රූප සහ ප්‍රතිසන්ධි කර්මජ රූප ආදී වශයෙන් කථා කළා. නමුත් මේ මාතෘකාව යටතේදී සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ලබන්නේත් ප්‍රත්‍යය වෙන්නෙත් චිත්ත චෛතසික ධර්මයෝ පමණක්මයි කියලා වටහා ගන්න එක නිවැරදියි කියලා හිතනවා ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

**පිළිතුර -** ඔව් ඒක එහෙම තමයි, මම අර උදාහරණයක් නිරූපණය කළා රූපයක් අරගෙන අවබෝධයේ පහසුව සඳහා. ලී කැල්ලක කොටුවක් අරගෙන ඕලාරික රූපමය උපමාවකින් කියලා දුන්නේ ඔය නාම ධර්ම කොටසේ විතරයි සම්ප්‍රයුක්ත ස්වභාවය ක්‍රියාත්මක වෙන්නේ. ඒකට හේතුව තමයි එකට පහළවෙන ධර්ම ස්වභාවය තිබෙන්නේ චිත්ත චෛතසික ධර්ම වල විතරයි. සම්ප්‍රයුක්ත වෙලා එන්න පුළුවන්කම තිබෙන්නනේ ඒවාට විතරයි. චිත්තජ රූප සහ කර්මජ රූප ඒවයින් ලැබෙන වෙනත් හේතු නිසා වක්‍රාකාරයෙන් මතුවෙන බල. නැත්නම් සම්ප්‍රයුක්ත භාවය චිත්ත චෛතසික ධර්මයන්ට පමණක්මයි ආවේනික. තෙරුවන් සරණයි!

**ප්‍රශ්නය -** තෙරුවන් සරණයි ගෞරවණීය ස්වාමීන්වහන්ස මාර්ග සිතේ මාර්ග අට කියනකොට විරති චෛතසික ඒ ඒ ක්‍රියා වලින් වැලකෙන අවස්ථාවන් වලදී පමණක් පහළ වෙන නිසා ඒ අටම යෙදෙන්න පුළුවන් රහතන්වහන්සේ කෙනෙකුට පමණක්ම ද කියලා ගැටලුවක් ආව.

**පිළිතුර -** ඒක තිබෙන්නේ මෙහෙමයි. ලෞකික කුසල් සිත් වල ඔය මාර්ග අංග යෙදෙනවා. ලෝකෝත්තර කුසල් සිත් වලත් මාර්ග අංග යෙදෙනවා. ලෝකෝත්තර කුසල් සිත් වල මාර්ග අංග යෙදෙන කොට පමණයි ගැඹුරු ස්වභාවයකින් ඕවා පහළ වෙන්නේ. නැත්නම් සාමාන්‍ය ලෞකික අවස්ථාවකදී කුසල් සිතක පහළ වෙන්නේ සීමාන්විත බොහෝම පොඩි ගානක්. ඒ සිත් වල ඒකාග්‍රතාවය එනවා වීර්ය එනවා ප්‍රඥාව කුසල චෛතසිකයක් හැටියට එනවා. විරති කියන්නා වූ සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව කියන ඒවා සාමාන්‍ය අවස්ථාවකදී පහළ වෙන්නේ වෙන වෙනම. නමුත් කෙලෙස් නසන අවස්ථාවේ පමණයි ඒක එක්තරා ක්‍රමයකට මේ තුනම එකට පොදි ගැහිලා එන්නේ. නැතනම් අර විදියට බොහෝම අඩු මට්ටමකින් තමයි තිබෙන්නේ. ලෝකෝත්තර සිත් වලට විතරයි ඒක නියෝජනය වෙන්නේ.

තව එකක් තමයි ඔය ලෝකෝත්තර සිත් කියන දේවල්වලට අරමුණු වෙන ධර්මය අමුතු එකක්. අපි දානමය පිනක් හරි සීලයක් හරි බණක් අහන අවස්ථාවේදී හරි කුසල්

සිතකට අරමුණු වෙන ආරම්මණය හැම වෙලාවේම හේතුවකින් හට ගත්ත එකක්මයි. සද්දයක් ගත්තත් හේතුවෙන් හටගත්ත එකක්. රූපයත් ගත්තත් හේතුවෙන් හටගත් එකක්. මලක් දැක්කත් මලක් ගැන හිතුවත් දෙකම හේතුවෙන් හටගත්ත එකක්. ඒක නිසා හැම වෙලේම මේ ලෞකික සිත්වලට අරමුණු වෙන දේ හැම වෙලේම හේතුවක ඵලයක් හරි ඵලයට හේතුවෙන දෙයක් හෝ මොකක් හෝ හේතු ඵල කථාවට ගැව්ච්ච එකක්මයි ඔය හැම තැනම හම්බවෙන්නේ. එකේදී විරති කථාව යන්නේ වෙන ආකාරයකට.

අපි මෙහෙම හිතුවොත් ගිරිමානන්ද සූත්‍රයේ තිබෙනවා විරාග සංඥාව සහ නිරෝධ සංඥාව කියලා හිතන්න කියලා තිබෙන සංඥාවල් දෙකක්. එතකොට ඒ මෙනෙහි කිරීම කරනකොට නිවන ප්‍රත්‍යක්ෂව අවබෝධ කරගත්තේ නැති කෙනෙක් නිර්වාණ ධාතුව ගැන හිත හිතා ඉන්නකොට එයාට සිතට අරමුණු වෙන නිවන හොඳම නිවන නොවෙයි. එයා හේතු ප්‍රත්‍යය ධර්ම වශයෙන්ම ඒකෙම කෙළවරක මෙන්න මෙහෙම වෙන්න ඇති කියලා උපකල්පනාත්මකව හදා ගත්ත එකක් තමයි ඒකෙ තිබෙන්නේ. ඒක නියමම නිර්වාණ ධාතුව නොවෙයි. ඒ අවස්ථාවේදී උනත් ආරම්මණික වශයෙන් මනෝමය කුසල ධම්මාරම්මණයක් උනාට ඒක නිවන නොවෙන නිසා එතැන පහළ වෙන්නෙත් නෑ එකවෙලාවට විරති චෛතසික, වෙන වෙන ආකාරයටයි පහළ වෙන්නේ. ලෝකෝත්තර සිතේ මේක වෙන්න හේතුව තමයි ‘හේතුවක ඵලයක් නොවෙන ධර්මයක්ම’ ‘හේතුවකුත් නොවෙන ධර්මයක්ම’ ‘සංඛත ස්වභාවයක් නොවෙන ධර්මයක්ම’ ඒ හිතට සප්ර්ෂ වෙන නිසා අමුතුම විදියට ආරම්මණ වෙන ඒ අරමුණේ ආනුභාවය නිසා ‘සම්මා වාචා’ ‘ සම්මා කම්මන්ත’ ‘සම්මා ආජීව’ කියන ධර්ම ගාම්භීර වශයෙන් apply වෙනවා.

සමහර වෙලාවට ප්‍රශ්නයක් ඇතිවෙනවා එහෙම නැති දෙයක් හිතට අරමුණු වෙන්න පුළුවන්ද මොකක්ද මේ කියලා, නමුත් බුදුරජාණන්වහන්සේ නැති දෙයක් නොවෙයි අරමුණු වෙනවා කිව්වේ, ලෝකෝත්තර සිතකට අවබෝධ වෙන්නේ තිබෙන දෙයක් නමුත් ඒකෙ සූක්ෂම බව නිසා ශාන්ත බව නිසා ඒක වචන වලට නංවලා කෙනෙකුට කියා ගන්න බෑ. ඒකයි තිබෙන්නේ, නමුත් ඒ ආරම්මණය නිසා ඔය ධර්ම ස්වභාව තුන පහළ වෙනවා. තෙරුවන් සරණයි!

**ප්‍රශ්නය -** ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ පැහැදිලි කරනකොට මතක් වෙච්ච දෙයක් තමයි ස්වාමීන්වහන්ස අපිට ප්‍රඥප්ති අරමුණු මතු වෙන්නේ කොයි වගේ අවස්ථාවලදීද කියලා. සාමාන්‍යයෙන් තේරෙනවා මෛත්‍රී භාවනාවක් වගේ දෙයක් කරනකොට සත්ව පුද්ගල භාවයෙන් අපි ප්‍රඥප්තියක් අරමුණු කරනවා කියලා. තවත් කොයි වගේ අවස්ථාවකද ස්වාමීන්වහන්සේ අපිට වෙන් කරලම ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැන ගන්න පුළුවන් අපි දැන් අරමුණු කරන්නේ ප්‍රඥප්තියක් පමණයි වෙන රූපයක් වත් නොවෙයි කියලා?

**පිළිතුර -** අපි ප්‍රඥප්ති වලින් වැහිලා ඉන්නේ. ඒ කියන්නේ, ජයන්ත මහත්මයා කියලා කියන්නේම ප්‍රඥප්තියක්. ජයන්ත මහත්මයා කියන ප්‍රඥප්ති වචන කැල්ලෙන් උලුප්පවලා දෙන රූප සංඥාවක් තිබෙනවා. මහත්මයාව කලින් දැකලා තිබෙන අය ඉන්නවා ඔතැන. එතකොට ජයන්ත මහත්මයා කියන වචනය එනකොටම ඒ වචනය

තමයි ප්‍රඥප්තිය, ඒ වචනය apply කරලා තිබෙන්නේ යම්කිසි රූපයකටයි. ඒ රූපකය දැකලා තිබෙන අයගේ හිත්වල ඒ රූපකය මතුවෙනවා. මතු උනහම මෙන්න මේ රූපකයට තමයි ජයන්ත මහත්මයා කියලා නම දාන්නේ කියලා ඒක වෙනම තේරෙනවා.

ඒවගේම මාව දැකලා තිබෙන අය ඉන්නවා. ඒ අයට කරුණු දෙකක් පහළ වෙනවා. එකක් තමයි ජිනාලංකාර ස්වාමීන්වහන්සේ කියන ප්‍රඥප්තිය. සමහරු මාව දැකලා නෑ. ඒක නිසා හිතට කාරණා දෙකක් වෙනවා. මාව දැකලා තිබෙන අය මගේ රූපය මේ විදියයි කියල මනෝමය වශයෙන් වද්දා ගන්නවා. ඒ මනෝමය රූපය වද්දාගෙන ඒ මනෝමය රූපයට දාල තිබෙන නම මේකයි කියලා නම වෙනම හඳුනා ගන්නවා. ඒ වෙලාවේදී ප්‍රඥප්තිය අපිට තිබෙනවා.

ඊළඟට අපි හිතමු අපිව දැකලා නැති කෙනෙක් ඉන්නවා කියලා. ඒ දැකලා නැති එක්කෙනාට ජිනාලංකාර හාමුදුරුවෝ කියලා නම ඇහෙනවා. නම කියන්නේ ප්‍රඥප්ති කෑල්ල. ඒ ප්‍රඥප්ති කෑල්ල කොහේට හරි දාන්න ඕනෑ. එතකොට හාමුදුරුවෝ කෙනෙක් නිසා සිවුරක් පොරවගෙන මෙහෙම ඇති කියලා වෙන ආධාරක රූපයක් හිතෙන් හදාගෙන ඒකට ජිනාලංකාර හාමුදුරුවෝ කියන කොටස දානවා. එතකොට ජිනාලංකාර හාමුදුරුවෝ කියන එක ප්‍රඥප්තිය, ඒ ගැන මනසේ හදාගෙන තිබෙන shadow එක තමයි ධර්මාරම්මණය වෙන්නේ. ඔය විදියට හැම තැනම ප්‍රඥප්ති වලින් වැහිලා තිබෙන්නේ. ඔළුවේ ඉඳන් පහළටම වැහිලා තිබෙන්නේ ප්‍රඥප්ති වලින්.

ඇත්තටම සමහර ප්‍රඥප්ති හයිය වැඩියි. සමහර ඒවගේ බල වැඩියි. සමහර ඒවා ගලවන්න අමාරුයි. සමහර ඒවා තිබෙනවා ලේසියි ගලවාගන්න. මේ ධර්ම විග්‍රහයන් උදව් වෙන්නේම උපකාර වෙන්නේම ප්‍රඥප්ති කඩන්න. අපි යම්කිසි දෙයකට ප්‍රඥප්තියක් හයි කරලා අපි ඒ ප්‍රඥප්තිය හයි කිරීම තුලින් තමයි නොවටිනා දෙයකට අගයන් වටිනාකම් දෙන්නේ.

මම මේ පින්වතුන්ට ඉස්සෙල්ලත් කිව්වා අපේ සේනාසනයේ තිබුණ පරණ tractor එක ගැන. අපි සේනාසනය ගන්න කාලේ තිබුණා පරණ tractor එකක්. ඒක කිසිම වැඩක් නැති මලකඩ ගොඩක්. එහෙම උනාට ඒකට අපේ කට්ටිය antique කියලා වෙන ප්‍රඥප්තියක් හයි කරා. Antique කියන ප්‍රඥප්තියට යටකරලා ඒක විකුණුවා. නොවටිනා කබල් දේවල්වලට ඔය ප්‍රඥප්ති හරහා වටිනාකම් දෙන්න පුළුවන්. ඒවගේම තමයි ඔය නම්බුනාම කීර්ති ප්‍රශංසා ඔක්කොම ප්‍රඥප්ති. ප්‍රඥප්තිය අනිත්‍ය දුක්ඛ අනාත්ම වලට අයිති වෙන්නේ නෑ. ඒකෙන් කියවෙන ධර්මය විතරක් අනිත්‍ය දුක්ඛ අනාත්ම වලට යටවෙනවා. ඒක නිසා ඔය නම් ගම් ඔක්කොම ප්‍රඥප්ති. තෙරුවන් සරණයි!

**ජයන්ත මහත්මයා -** බොහෝම පිං ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ සංස්කාර නිමිති කියලා අපිට දීර්ඝ වශයෙන්ම කියලා දුන්නෙත් ඔය ප්‍රඥප්ති කියන එකම තමයි කියන එක දැන් තේරෙනවා ස්වාමීන්වහන්සේ.

**පිළිතුර -** ඔව්, අපිට ඔලුව උස්සන්න බැරි වෙලා තිබෙන්නේ ඔන්න ඔය වැඩේ නිසයි.

**ප්‍රශ්නය -** එතකොට ස්වාමීන්වහන්සේ ප්‍රඥප්ති කියන ඒවා හේතු ඵලයකින් ඇතිවෙනවා කියලා ගන්න බෑ නේද ස්වාමීන්වහන්ස.

**පිළිතුර -** නෑ ප්‍රඥප්ති හේතු ඵල වලින් හැදෙන්නේ නෑ. ප්‍රඥප්තිය කියල කියන්නේ සංඥා මාත්‍රයක් පමණයි. එතකොට කියන්න පුළුවන් කෙනෙකුට සංඥාව කියලා කියන්නෙත් ඔය හිතේ කෑල්ලක් නේද කියලා. 'සංඥාව' කියන ධර්මය හේතුවෙන් හටගන්නා එකක්. ඒක හිතේ part එකක් (වේදනා සංඥා සංඛාර). එතකොට සංඥාව කියන එකෙන් හඳුනා ගන්න දේවල් තිබෙනවා. සමහර ඒවා හේතුවෙන් හටගන්නා දේවල්මයි, රූප වේදනා වගේ දේවල්. නමුත් ඒවාට උඩින් දාන තව අමුතු වැඩක් තිබෙනවා, ඒ තමයි හේතු වලින් හටගත්ත ඒවා එකකට එකක් වෙන් වශයෙන් හඳුනා ගැනීමට උඩින් තවරනවා නම් කෑලි. ආන්න ඒවා තමයි අනිතය දුක්ඛ අනාත්ම වෙන්නේ නැත්තේ.

කෝප්පය කියන වස්තුව අනිත්‍ය දුක්ඛ අනාත්ම වෙනවා, ඒක හැදෙනවා කැඩෙනවා නමුත් කෝප්පය කියන වචනය අනිත්‍ය දුක්ඛ අනාත්ම වෙන්නේ නෑ. එකයි ඒකෙ වෙනස.

තෙරුවන් සරණයි!

**ජයන්ත මහත්මයා -** තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අප්‍රමාණ පිං බොහෝම හොඳ පැහැදිලි කිරීමක් අපිට අහන්න ලැබුණේ. සවනට සිසිලස වෙනුවෙන් අපි ඔබ වහන්සේට ගෞරව පූර්වකව කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස අපිට මේ ලබා දෙන සේවයට, එය කියා නිම කළ නොහැකියි. ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් නැවත වරක් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙස. තෙරුවන් සරණයි!

**ස්වාමීන්වහන්සේ -** හොඳයි හැම දෙනාටම සැනසිල්ලක් වේවා! අදත් සුපුරුදු විදියටම මේ සවනට සිසිලස ධර්ම මණ්ඩපයට එක්කාසු වෙලා මේ ලෝකෙ වටේ ඉන්නා වූ විසාල පිරිසක් මේ ධර්මය අහනවා හිතනවා මෙනෙහි කරනවා. අදත් පින්වත් ජයන්ත මහත්මයා ඉදිරිපත් වෙලා සම්බන්ධීකරණ වැඩේ කළා. දැන් බොහෝම කාලයක් තිස්සේ ලලිත් දළුවත්ත මහත්මයාගේ බොහෝම කාරුණික පුණ්‍ය සිතින් සංවිධානය කරගෙන පවත්වාගෙන එන මේ දහම් ගමන අදත් තව අවස්ථාවක් උනා. අදත් ධර්මය හිතීමෙන් මෙනෙහි කිරීමෙන් ඇසීමෙන් උපදවාගත්ත සියලුම කුසල ධර්මයන්ගේ බලයෙන් සහ රත්නත්‍රයේ අනන්ත ගුණ බලයෙන් පින්වත් ලලිත් මහත්මයාට නිදුක් නිරෝගී දීර්සායුෂ වේවා කියලා අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ලලිත් දළුවත්ත මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් ජයන්ත මහත්මයාටත් ඒවගේම ප්‍රශ්න ඇසූ සියලුම දෙනාටමත් මේවා අසාගෙන හිතාගෙන මෙනෙහි කරමින් සිටින මේ පින්වත් සැම දෙනාටමත් මේ විදියට ධර්මය ගාම්භීර වශයෙන් හිත හිතා මෙනෙහි කරගෙන ගොස් මේකේ පතුලටම ගිහිල්ලා මේ ධර්ම වලින් අයින් කරන්න තිබෙන ධර්ම ටික ඔක්කොම අයින් කරලා අවබෝධ කරගන්න තිබෙන දේවල් සියල්ලම අඩු නැතුව අවබෝධ කරගෙන අත්හරින්න තිබෙන දේවල් සියල්ලම අතහැරලා ඒවගේම නිර්වාණ ධාතුව කියන ධර්මයට ලංවෙන්න නිර්වාණ ධාතුවට නුවණින් ඥානයෙන් පිවිසෙන්න මෙය ධර්ම මාර්ගයක් වේවා! හේතුවක් වේවා! මේ කුසල් බලයෙන් සියලු දෙනාටම උතුම් නිවන් අවබෝධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා සෙත් පතනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.